වගා සහනාධාර චක්‍රලේඛ අංක: 24

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 349, ගාලු පාර,
කොළඹ 03.

1990.01.12 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

බදු ඉඩම් සඳහා සහනාධාර ගෙවීම.

"තේ වගා කටයුතු සඳහා අනුයෝජිතයෙකු පත් කිරීම" මැයෙන් යුත් 1988.12.05 දිනැති වගා ආධාර චක්‍රලේඛ අංක 05 ට අමතරවයි.

02. අධිකාරියේ මෙතෙක් පැවති ක්‍රියාමාර්ගය අනුව බදු ඉඩමක් සහනාධාර සඳහා ඉල්ලුම් කිරීමේදී යටත් පිරිසෙයින් බදු කාලය අවුරුදු 20 ක් වත් ඉල්ලුම්කරු නමින් තිබීම අවශ්‍යය. (වයා/ව.ආ/ප්‍රති - 1985.01.02) එසේ වුවද අධිකාරියේ වගා සහනාධාර කොන්දේසි සරල කිරීමේ පරමාර්ථය මත යථෝක්ත චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති තේ වගා කටයුතු සඳහා අනුයෝජිතයෙකු පත්කිරීමේ ක්‍රමය යටතේම ඉඩම්වල බදු ගැනුම් කරුවන්ටද අනුයෝජිතයන් ලෙස කටයුතු කළහැකි බවට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

03. බදුකරුද ඉඩම අයිතිකරුගේ අනුයෝජිතයා වශයෙන් පත්කිරීම පිණිස විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සී - 10 ආකෘති පත්‍රය මගින් අධිකාරිය වෙත ඉල්ලුම් කළයුතු අතර, ඒ අනුව බදු කාලසීමාව පිළිබඳ නොසලකා එකී අනුයෝජිතත්වය මත කටයුතු කළ හැකිය.

04. තවද වයා/ව.ආ/ප්‍රති සහ 1985.01.22 දිනැති ලිපියේ සඳහන් බදු කාලය සහ ඊට අදාළ කොන්දේසි මෙයින් අවලංගු කරන බව දන්වමි.

ආචාර්ය සරත් බී. මනන්වත්ත
සභාපති.

පිටපත්:
1. සාමාන්‍යාධිකාරී.
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන)
3. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කම්හල්/තාක්ෂණික සේවා)
4. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
5. අභ්‍යන්තර විගණක.
6. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී.
7. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.

ජ/01/12